# යාපනයේ හඳුනා නොගත් ගුහා ප්‍රදේශය ගැන පුරාවිද්‍යාත්මක පර්යේෂණයක් ඉල්ලයි

වවුනියාව - රසාදි චතුරංගි ගමගේ

යාපනයේ වඩමරාච්චි වැල්වෙට්ටිතුරේ ප්‍රදේශයේ මෙතෙක් තහවුරු කරගෙන නොමැති ගුහා ප්‍රදේශයක් පුරාවිද්‍යාව මඟින් හඳුනාගෙන එම භූමියට ආරක්ෂාව යොදන ලෙස උතුරු පළාත් සභාවේ හිටපු සභාපති සී.වී.කේ. ශිවඥානම් මහතා ඉල්ලා සිටියි.

අනාදිමත් කාලයක සිට මෙම ගුහා ප්‍රදේශය පෙම්වතුන් හඳුනාගෙන ගුහා තුළ නොමනා ක්‍රියා කරන නමුත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මේ ස්ථානය කෙරෙහි සැලකිල්ලක් දක්වා නොමැත.

යාපනයේ ජනතාව මෙම ස්ථානය "කර්කුකායි ගුරුඩා" (කර්කුකායි නමැති ගුහාව) ලෙස හඳුන්වයි. මේ ස්ථානයේ බොහෝ අද්භූත සිදුවීම් වන බව විවිධ ජනප්‍රවාද පැතිරෙමින් පවතී.





කිසිදු අයකු මේ ස්ථානය ගැන නොදන්නා නිසා එය ප්‍රසිද්ධියට පත්කළ යුතුව ඇති බව පවසන උතුරු පළාත් සභාවේ හිටපු සභාපතිවරයා පුරාවිද්‍යා නිලධාරීන් දෙමළ ජනතාවට අයත් ඉඩම්වල කැණීම් කටයුතු කිරීමට දක්වන උනන්දුවට වඩා වැඩි උනන්දුවක් මෙවැනි ස්ථාන සොයා තහවුරු කිරීමටත් ප්‍රසිද්ධ කිරීමටත් දැක්විය යුතු බවද කියා සිටියේය.

2021.06.03 මව්බිම පිටු අංක 03